# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

### තාක්ෂණ අමාත්‍යාංශය

### ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර - ජ්‍යෙෂ්ඨ කළමනාකරු සේවා ගණය (HM 1-1)

## ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර - 01

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, වාණිජ, මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ ව්‍යාපාර පරිපාලන විශේෂ උපාධියක් (වසර හතරක) හෝ පංති සාමාර්තයක් සහිත (වසර තුනක) සාමාන්‍ය උපාධියක්.

සමග

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ, රාජ්‍ය කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ මෙම තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තිය ආයතනයක සාමාජිකත්වය,

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු, සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "**කළමනාකරණ තලයේ**" අවම වසර 13 ක පළපුරුද්දක් ලබාතිබීම.

**අභ්‍යන්තර (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.
2) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ, රාජ්‍ය කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක සාමාජිකත්වය සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක කළමනාකණ ගණයේ වසර 13 ක පළපුරුද්ද.

අංශයේ අධීක්ෂණ කටයුතු සම්බන්ධව තෝරාගත් අපේක්ෂකයා වෙත වගකීම පැවරේ. ඔහු / ඇය සතුව, සියලු තලවල කාර්ය මණ්ඩලය සඳහා විශිෂ්ට නායකත්ව හැකියාවන් හා සන්නිවේදන කුසලතා පැවතිය යුතුය.

**වැටුප් පරිමාණය** ශ්‍රී ලංකා රුපියල් 80,295.00 - 15X2270.00 - 114,345.00

**වයස** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.)

**වෙනත් ප්‍රතිලාභ**

1. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 1/2015 හා PED1/2015(i) ප්‍රකාරව ප්‍රවාහන දීමනාව ලබාදේ
2. ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ලබාදේ.
3. ජීවිත රක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණ ආවරණය
4. වෛද්‍ය වියදම්, සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කෙරේ.
5. මහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ වාර්ෂික දිරි දීමනාවක්.
6. වෘත්තීය පරිසරයක රාජකාරි කිරීමේ අවස්ථාව
7. වෘත්තීය දීමනාව.
8. සන්නිවේදන දීමනාව.

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් අදාළ විස්තර සමග සහතිකවල පිටපත් හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සඳහන් කර, තම අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන්, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට, 2023-11-06 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම් කරනු ලබන තනතුර අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

**දුරකථනය - 011-2671567-72**